මත්ද්‍රව්‍ය සඳහා සම්බන්ධ වූවන්ව "කුඩ්ඩා", "කුඩුකාරයා" වැනි යෙදුම් ඔස්සේ සෘණාත්මකව ලේබල්ගත කිරීමේ ඇති ගැටලුව වන්නේ, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින්නන් සම්බන්ධයෙන් වන සමාජ ගර්හාව තවත් තීව්‍ර වීමයි. ඒ ඔස්සේ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටි අයෙකුට පුනරුත්ථාපනයකින් පසුව වුවද සමාජයට එක් වීමේ ඉඩ අවහිර වීමයි.

යුදහමුදා විශේෂ විමර්ශන ඒකකයේ උසස් නිලධාරියෙකු බව පවසමින්, ව්‍යාජ නම් සහ තනතුරු භාවිතා කරමින් දිවයිනේ විවිධ ප්‍රදේශවල මුදල් සම්මාදමේ යෙදුණු, හමුදාවෙන් පලාගිය සෙබළකු බවට පැවසෙන පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනුණු පුවත, ලංකාදීප (අගෝස්තු 15, 2023) සහ දිනමිණ (අගෝස්තු 16, 2023) පුවත්පත්වල වාර්තා වී තිබුණේ මෙසේය.

ලංකාදීප: "කුඩුකාරයා කපිතාන්ට ඇඳලා රට වටේ සම්මාදමේ ගිහින්"

දිනමිණ: "බුද්ධි කපිතාන්වරයෙකු ලෙස පෙනී සිටිමින් ප්‍රධාන නගරවල මුදල් සම්මාදමේ ගිය හිටපු සෙබළා රිමාන්ඩ් භාරයට"

මෙම සැකකරුවාව වඩාත් යෝග්‍යව හඳුන්වා දී ඇති පුවත් සිරස්තලය ලෙස ඔබ තෝරා ගන්නේ කුමක්ද?